ගාල්ල මහා නගර සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අහිතකර මතය

ගාල්ල මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට ගාල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (ඉ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරියට ලද කඩ කුලී හා හිඟ කඩ කුලී ශේෂය රු.718,761 ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වත්කම් වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු අතර ඉදිරියට ලද කඩ කුලී කලින් ලද ආදායම් යටතේ ගිණුම් ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 110.64 ක විශ්‍රාම වැටුප් දායකය ගිණුම්ගත කර නොතිබුණි.	ලේඛනගත සාක්ෂි ප්‍රමාණවත් නොවන බැවින් මේ දක්වා ගිණුම්ගත කර නොමැති බව.	සාක්ෂි තහවුරු කරගෙන විශ්‍රාම වැටුප් දායකය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගෙවිය යුතු රු.මිලියන 2.89ක ජල බිල්පත් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.	මුදලෙහි නිවැරදිතාවය සනාථ කර ගැනීමෙන් පසු පමණක් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	ගෙවිය යුතු ජල බිල්පත් වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බිල්පත් ඉදිරිපත් නොකර කර්මාන්ත 29 ක් සඳහා රු.මිලියන 67.64 ක් ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණු බැවින් ප්‍රවර්තන වර්ෂයේ වියදම් සහ ණයහිමියන් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කර බිල්පත් ඉදිරිපත් නොකළ හා වැඩ ඉටුවෙමින් පැවති ව්‍යාපෘතිවලට අදාළව ණයහිමි ප්‍රතිපාදන සලසා තිබූ බව.	සහතික කළ වැඩ වටිනාකම මත ණයහිමි වෙන් කිරීම සිදු කල යුතුය.

(ඉ)	ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී පෙන්වා දී තිබුණු, සභාවට අයත් එකතු පිරිවැය රු.මිලියන 4.58 ක් වූ වාහන 18 ක් සහ පිරිවැය හඳුනාගත නොහැකි වාහන 19 ක් වෙන්දේසි කර ඉවත් කර තිබුණු නමුත් ඒවායේ වටිනාකම ස්ථාවර වත්කම් ගිණුම්වලින් ඉවත් නොකිරීම නිසා ස්ථාවර වත්කම් වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	වෙන්දේසි කර ඇති වාහනවලට අදාළ වටිනාකම් ස්ථාවර වත්කම් ගිණුම්වලින් ඉවත් කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු සනාථන ලිපි අනුව සභාව සතු ස්ථාවර තැන්පතු වටිනාකම රු702,934 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	වර්ෂය අවසානයට නිවැරදි ආයෝජන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු පොළී ආදායම හා වර්ෂයේ පොළී ආදායම රු.මිලියන 10.08 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 අවසාන ගිණුම මඟින් නිවැරදි කරන බව.	පොළී ආදායම් හා ලැබිය යුතු පොළී ආදායම් ගිණුම්ශේෂ නිවැරදි කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු ලැප්ටොප් පරිගණක යන්ත්‍රවල වටිනාකම රු.168,000ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් ස්ථාවර වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	ස්ථාවර වත්කම් වටිනාකම නිවැරදි කළ යුතුය.
(එ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, ආදායම් ණයගැති ශේෂය රු.247,561 ක් අඩුවෙන් හා ඉදිරියට කළ ගෙවීම් ශේෂය රු.247,561 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	ආදායම් ණයගැති හා ඉදිරියට කළ ගෙවීම් ශේෂ නිවැරදි කළ යුතුය.

1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසන් දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 11 කට අදාළ ගිණුම් ශේෂයන් සහ ඊට අදාළ ලේඛන හා තහවුරු කිරීම් සමඟ සැසඳීමේ දී එකතුව රු.මිලියන 151.73ක වෙනසක් විය.	2024 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශය අනුව සහා තීරණයන් මඟින් 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිදු කළ තොග සත්‍යාපනයෙන් හඳුනාගත් භෞතික තොග වටිනාකම අනුව ඉදිරියට ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරන බව හා අනෙකුත් නොසැසඳීම් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ශේෂවල වෙනස්කම් වලට හේතු හඳුනාගෙන නිවැරදි කිරීම් කළ යුතුය.

1.6.3 අවිනිශ්චිත ගිණුම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2004 වර්ෂයේ සිට පැවත එන රු.111,553 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.	මෙම ශේෂයට අදාළ තොරතුරු සභාව සතුව නොපවතින බැවින් ගිණුම්වලින් කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව (දෙ.ප) වෙත යොමු කර ඇති බව.	ශේෂය ඇති වීමට අදාළවූ හේතු හඳුනා ගෙන කඩිනමින් නිවැරදි කිරීම සිදුකළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතු වටිනාකම රු.මිලියන 384.3 ක් වූ ගිණුම් ශේෂ 07 කට අදාළ උපලේඛන, ශේෂ සනාථන ලිපි හා භෞතික තොග සත්‍යාපන වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	ඉදිරියේදී නිවැරදි කරන බව.	ගිණුම් ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා අදාළ ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104**	2020 වර්ෂය හා 2024 වර්ෂය අතර කාල පරිච්ඡේදය තුළ සභාව සතු වාහන 06 කට සිදු වී ඇති අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	කමිටු වාර්තා ඉදිරිපත්වී නොමැති බැවින් කමිටු වෙතට සිහි කැඳවීම් ලිපි යොමු කර ඉදිරි කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ආ)	**දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරණ චක්‍රලේඛයේ 05 වන ඡේදය**	කඩ කාමර බදු දීමට අදාළ සෑම ගිවිසුමක්ම වසර 03කට වරක් යාවත්කාලීන කළ යුතු වුවද , සභාව සතු කඩ කාමර 29කට අදාළ ගිවිසුම් එසේ යාවත්කාලීන කර නොතිබුණි.	ගිවිසුම් යාවත්කාලීන කරමින් පවතින බව.	චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සභාව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.මිලියන 20.23 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.මිලියන 111.86 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
1993 නොවැම්බර් 13 දිනැති නාගරික සංවර්ධන අධිකාරි සභාපතිගේ සැලසුම් චක්‍රලේඛ අංක 15 අනුව කටයුතු කිරීම සඳහා මහා නගර සභාව විසින් පවත්වනු ලබන ස්ථාවර තැන්පතු ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 18 ක ශේෂයක් පැවතිය ද, චක්‍රලේඛ උපදෙස් අනුව එම මුදල් යෙදවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සභාව විසින් ඉදිරිපත් කර නොතිබුණි.	මූල්‍ය ප්‍රතිපාදන සකසා ගැනීමට අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	මුදල් යෙදවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සභාව විසින් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරිය විසින් විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම් ප්‍රභවය	2024 ඇස්තමේන්තුගත ආදායම රු.	2024 බිල්කළ ආදායම රු.	2024 රැස්කළ ආදායම රු.	2024 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.	2023 ඇස්තමේන්තුගත ආදායම රු.	2023 බිල්කළ ආදායම රු.	2023 රැස්කළ ආදායම රු	2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.
වරිපනම් හා බදු	127,500,000	113,603,805	124,153,951	210,119,927	172,500,000	108,277,586	118,312,162	220,670,073
කුලී	114,204,000	136,410,070	107,894,265	99,779,748	136,001,000	117,417,075	88,117,584	71,263,943
බලපත්‍ර ගාස්තු	28,029,000	42,271,891	44,098,147	7,670,591	28,529,000	29,916,328	28,090,072	9,496,847
වෙනත් ආදායම්	74,514,000	145,365,210	146,062,396	743,282	87,275,000	121,817,764	125,705,498	1,440,468
	344,247,00	437,650,976	422,208,759	318,313,548	424,305,000	377,428,753	360,225,316	302,871,331

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වරිපනම් හා බදු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට වරිපනම් හා බදු මුළු හිඟ ආදායම රු.මිලියන 220.67 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් වූ රු.මිලියන 113.6 ක් ඇතුළත්ව වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.මිලියන 334.27 ක් වුවද, රැස් කළ ආදායම රු.මිලියන 124.15 ක් වීමෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 37 ක් වැනි පහළ අගයක පැවති අතර, වර්ෂ අවසානයට රු.මිලියන 210.12 ක ශේෂයක් අයවීමට පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී වරිපනම් ඒකක 22,352 කින් කිසිදු බදු මුදලක් අය කරගෙන නොතිබුණු හෙයින් ඊට අදාළ හිඟ ශේෂය රු.මිලියන 151.54 ක් විය.	ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය සියයට 38.52 ක් බව	හිඟ ආදායම රැස් කිරීමට අදාළ නිශ්චිත කාල රාමුවක් සහිත වැඩපිළිවෙලක් සකස් කර ඒ අනුව හිඟ ආදායම් කඩිනමින් රැස් කර ගත යුතුය.
(ii)	2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 180.63 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂයෙන් රු.මිලියන 126.03 ක් වර්ෂ 5 කට අධික කාලයක සිටද , රු.මිලියන 21.79 ක් වර්ෂ 3ත් 5 ත් අතර කාලයක සිට ද හිඟව පැවති නමුත් ,මහා නගර සභා ආඥා පනතේ 252(1) වගන්තිය ප්‍රකාරව	බිල් කිරීම් ශුන්‍ය වන දේපල ලැයිස්තු ලබාගෙන ආදායම් පරීක්ෂක නිලධාරීන් ලවා පරීක්ෂා කිරීමට අවශ්‍ය මූලික	හිඟ ආදායම රැස් කිරීමට අදාළ නිශ්චිත කාල රාමුවක් සහිත වැඩපිළිවෙලක් සකස් කර ඒ අනුව

	එම හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	කටයුතු සිදු කර ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය.
(iii)	1946 අංක 30 දරණ බදු හා තක්සේරු කරන ආඥා පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් දේපළ වර්ෂ 5කට වරක් තක්සේරුව සිදු කළ යුතු වුවත්, 2015 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව මත පදනම්ව වරිපනම් බදු අය කර තිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන තක්සේරු වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරන බව.	පනත ප්‍රකාරව වරිපනම් තක්සේරුවක් ලබා ගෙන වරිපනම් අය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	**කුලී**		
(i)	බදුකරුවන් 15 දෙනෙකු වෙත තිස් අවුරුදු කාලයකට බදු පදනම මත ලබා දී තිබුණු ඔරොප්පුවත්ත මධ්‍යම වෙළඳපොළෙහි බිම් කැබලි 21 ක බදු ගිවිසුම් කාලය ඉකුත් වී මාස 05 ත් අවුරුදු 3 ත් අතර කාල පරාසයක් ගත වී තිබුණද, එම බදු ගිවිසුම් අළුත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. නව තක්සේරු මුදල අනුව 2024 දෙසැම්බර් 31 දක්වා මෙම බදුකරුවන්ගෙන් අයවිය යුතු රු.මිලියන 19.91 ක මුදලින් තැන්පත් මුදල් ලෙස රු.මිලියන 1.14 ක් පමණක් අයකර තිබුණි.	නව තක්සේරුව සඳහා විරෝධතාවයන් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති බැවින් ගිවිසුම්ගත වීමට මේ දක්වා පැමිණ නොමැති බව හා තක්සේරු වාර්තා අනුව බදු අය කිරීමට ලිපි යොමු කර ඇති බව.	චක්‍රලේඛ උපදෙස් පරිදි බදු ගිවිසුම් අලුත් කිරීමට හා නව තක්සේරුව අනුව බදු මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය සඳහා 2013 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව වාර්ෂික රු.මිලියන 1.6 ක බදු කුලිය වසර 5ක් දක්වා පමණක් වලංගු වන නමුත් ,එකී තක්සේරුව අළුත් කර ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය දක්වාම එම තක්සේරු වටිනාකමට බදු අය කරමින් පැවතුණි.	අදාළ ආයතන සමඟ සාකච්ඡා කර අදාළ ගැටළු නිරාකරණය කිරීමෙන් පසු කඩිනමින් තක්සේරු වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරන බව.	නව තක්සේරුවක් සිදු කර ඒ අනුව ආදායම අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.මිලියන 71.26 ක් වූ හිඟ කුළී ආදායම සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 99.78 ක් දක්වා වර්ධනය වී තිබුණි.	හිඟ ශේෂ අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව.	මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව හිඟ ආදායම් අයකර කර ගත යුතුය.
(iv)	සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩ කුලී ශේෂය රු.මිලියන 23.24 ක් වූ අතර, ඉන් කඩ කාමර 266 කට අදාළ රු.මිලියන 20 ක ශේෂය	හිඟ ශේෂ අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව.	මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව

	වසර 05 කට වැඩි කාලයක සිට අය නොවී පැවති නමුත්, මහා නගර සභා ආඥා පනතේ 253(1) වගන්තිය ප්‍රකාරව එම හිඟ ශේෂ අය කරගෙන නොතිබුණි.		හිඟ ආදායම් අයකර කර ගත යුතුය.
(v)	දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක 2010/01 දරණ චක්‍රලේඛයේ 06 වන ඡේදය අනුව කඩ කාමර බදු මුදල වසර 05 කට වරක් නැවත තක්සේරු කළ යුතු වුවත්,ඊට අනුකූල නොවී, ගාල්ල මධ්‍යම බස නැවතුම්පල කඩ කාමර 24 ක් 2013 වර්ෂයේදී බදු දීමේදී වාර්ෂික බදු මුදල අවුරුදු තුනෙන් තුනට සියයට 10 කින් වැඩිවන සේ බදු අය කිරීමේ පදනම මත ගිවිසුම්ගතවී තිබීමෙන් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි.	වසර 03 න් 03ට සියයට 10ක උපරිමයකට යටත්ව බදු කුලී අය කිරීමට ගිවිසුම සංශෝධනය කරගත යුතුද යන්න පිළිබඳව නීති නිලධාරී උපදෙස් පරිදි පළාත් පාලන කොමසාරිස් වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බව.	චක්‍රලේඛ උපදෙස් අනුව ගිවිසුම් සකස් කර ගැනීමට කටයුතු කළ යුතු අතර ඊට අනුකූල නොවී කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(vi)	මහ වීදිය සාප්පු සංකීර්ණයේ අංක 31 දරණ කඩ කාමරයේ බදුකරු ගිවිසුම් අවසන් කිරීමකින් තොරව කඩ කාමරය අතහැර ගොස් තිබුණු අතර තක්සේරු වටිනාකම රු.20,000 ක් වූ මෙම කඩ කාමරය නැවත ටෙන්ඩර් කර බදු දීමට සභාව කටයුතු කර නොතිබීමෙන් 2022 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 0.72 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.	බදුකරු විසින් ගෙවා ඇති මුදල මුදල් කමිටු තීරණය අනුව සභාවේ ආදායමට ගෙන ඇති බව.	අත්හැර දමා ඇති කඩකාමරය ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කළ යුතුය.
(vii)	2017 වර්ෂයේ සිට වසා දමා ඇති අළුත්වැඩියා කළ යුතු තත්වයේ පවතින ඔරොප්පුවත්ත මධ්‍යම වෙළඳපොල පැවති කඩ කාමර 06 ක් අළුත්වැඩියා කර ආදායම් ඉපයීම සඳහා සභාවේ අවධානය යොමුවී නොතිබුණි.	අළුත්වැඩියා කර ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බව.	අළුත්වැඩියා කර ටෙන්ඩර් කර කඩකාමර කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(viii)	ගාල්ල මහ නගර සභාවට අයත් නාගරික වෙළඳපොල තුළ පැවති කඩ අල්ලි 236 න් කඩ 41 කට අදාළව පමණක් 2024 වර්ෂයේදී වාර්ෂික බදු ලෙස රු.378,244 ක් බිල් කිරීම් සිදු කර තිබුණද, ඉන් රු.93,309ක් පමණක් රැස් කර තිබුණි. ඉතිරි කඩ අල්ලි 195 ට අදාළව බදු අයකර නොතිබුණු අතර මෙම කඩ කාමර වල තක්සේරු වටිනාකම මත බදු අය කිරීමක් සිදු නොකර වාර්ෂිකව සියයට 10 බැගින් වැඩි වන සේ බදු කුලී අය කර තිබුණි.	ගොඩනැගිල්ල අළුත්වැඩියා කර නැවත ටෙන්ඩර් කිරීමට අනුමැතිය ලැබී ඇති බව.	ගොඩනැඟිල්ල අළුත්වැඩියා කර ටෙන්ඩර් කර කඩකාමරවල තක්සේරු වටිනාකම මත බදු අය කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**බලපත්‍ර ගාස්තු**		
(i)	සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ බලපත්‍ර ගාස්තු ආදායම ඇතුළුව වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.මිලියන 51.77	වර්ෂය අවසානයේ හිඟ ශේෂය ඉදිරියට පවත්වා ගෙන	නිශ්චිත කාල රාමුවක් සහිත වැඩපිළිවෙලක්

	ක් වුවද, රැස්කළ ආදායම රු.මිලියන 44.1ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 7.67 ක හිඟ ශේෂයක් අයවීමට පැවතුණි.	නොයන බව.	සකස් කර ඒ අනුව හිඟ ආදායම කඩිනමින් අයකර ගත යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයට අදාළව දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර දැන්වීම් පුවරු 476 කට අදාළව වර්ෂය සඳහා රු.මිලියන 14.55 ක් බිල් කර තිබුණි. ඉන් දැන්වීම් පුවරු 283 කට අදාළ රු.මිලියන 8.93 ක මුදලක් තව දුරටත් අය විය යුතුව පැවතුණි.	ඉදිරියේදි අය කර ගැනීමට කටයුතු කරන බව.	දැන්වීම් පුවරු සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකළ යුතු අතර අප්‍රමාදව ආදායම් අය කර ගත යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂයට අදාළ ව්‍යාපාර බදු, කර්මාන්ත බදු, වෙළඳ බලපත්‍ර හා සියයට 1ක බලපත්‍ර ගාස්තු අය කළ යුතු ආයතන 3258 න් ආයතන 2645 කින් පමණක් රු.මිලියන 22.57 ක් අයකර තිබුණු අතර ඉතිරි ආයතන 613 න් ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදි අය කර ගැනීමට කටයුතු කරන බව.	නිශ්චිත කාල රාමුවක් සහිත වැඩපිළිවෙලක් සකස් කර ඒ අනුව හිඟ ආදායම කඩිනමින් අයකර ගත යුතුය.
(iv)	පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත 39 කට අදාළ ආයතන 541 ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගැනීමෙන්, බලපත්‍ර ගාස්තු වශයෙන් රු.මිලියන 2.87ක්, පරීක්ෂණ ගාස්තු වශයෙන් රු.මිලියන 5.74 ක් සහ ඉල්ලුම්පත් ගාස්තු වශයෙන් රු.319,190 ක් සභාවට අහිමි වී තිබුණු අතර මෙම කර්මාන්ත මඟින් පරිසරයට වන හානිය පිළිබඳ සභාවේ අවධානය යොමු වී නොතිබුණි.	මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිකුත් කර ඇති ගැසට් නිවේදනය අනුව කටයුතු කරන බව	මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිකුත් කර ඇති ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	**වෙනත් ආදායම්**		
	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.මිලියන 225.42 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.මිලියන 29.61 ක් ලැබිය යුතුව තිබුණි.	හිඟ ශේෂ අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අය කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සහා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා

සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	රු.මිලියන 244.19 ක පිරිවැයක් දරමින් මහා පරිමාණයෙන් ඉදිකළ කවෂිමා කොම්පෝස්ට් ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු 2023 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට කසළ කළමනාකරණය විධිමත් පරිදි සිදු වී නොතිබුණු අතර කොම්පෝස්ට් නිෂ්පාදනයද ආරම්භ කර නොතිබුණි.	අදාළ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩ පහසුකම් නොමැති බව.	ව්‍යාපෘතිය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොකිරීමට හේතු හඳුනාගෙන ව්‍යාපෘතිය සඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා සැලැස්මක් පිළියෙල කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා, මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණු අතර 2008 වර්ෂයේ සිට කසළ බැහැර කිරීම සඳහා භාවිතා කරමින් තිබෙන ඉඩමේ අයිතිය සභාව වෙත පවරා ගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි.	පරිසර බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරන බවත්, ඉඩම අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	කඩිනමින් පරිසර බලපත්‍රය ලබා ගැනීමට හා ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	කසළ මගින් හටගන්නා ක්ෂරිත අවට ඉඩම්වලට හා ආසන්නයේ ඇති ජලාශයට ගලා යාම හේතුවෙන් ඇතිවිය හැකි හානි වළක්වා ගැනීමට ක්ෂරිත පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කිරීමට උපදෙස් ලබා ගැනීමට අදාළව රු.44,492 ක වියදමක් සභාව විසින් දරා තිබුණු නමුත් එම පිරිපහදු පද්ධතිය 2024 වර්ෂය අවසන් වන විටත් ස්ථාපිත කර නොතිබුණි.	මහජන පීඩාව යටතේ නඩු කටයුත්තක් පවතින බැවින් එය අවසන් වූ පසු අදාල ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව.	ක්ෂරිත පිරිපහදු පද්ධතිය නිශ්චිත කාල රාමුවක් තුළ කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ ඇති ග්‍රාම සේවා වසම් 43 ක නිවාස 25,149 ක් අතරින් සමාලෝචිත වර්ෂය තුළ සභාවේ මදුරු මර්ධන පරීක්ෂා කිරීම්වලට ලක් නොවූ නිවාස 16,660ක් පැවතුණි. මදුරුවන් බෝවන ස්ථාන 661 ක් හඳුනාගෙන ඒවාට රතු නිවේදන නිකුත් කර තිබුණද, නැවත ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ඩෙංගු බෝවිය හැකි අවධානම් තත්වයෙන් ඉවත් කර තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා පසු විපරමක් සිදු කර නොතිබුණි.	ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කරන බව	ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීම හා මේ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් නිශ්චිතව වගකීමට යටත් කළ යුතුය.

(ඇ)	රු.මිලියන 4.83 ක පිරිවැයක් දරමින් ඉදි කර 2007 වර්ෂයේදී මහ නගර සභාවට පවරා තිබුණු අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ (කොවැම් මධ්‍යස්ථානය) මෙහෙයුම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් රු.මිලියන 2.02 ක් වූ ට්‍රැක්ටර් 02 ක් හා ට්‍රේලරයක් නිෂ්කාර්යව පැවතුණි.	ක්‍රියාකාරී තත්වයට පත්කොට මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව.	අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාකාරි තත්ත්වයට පත්කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේදී අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන් සඳහා පාසැල් පොත් හා උපකරණ බෙදා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පාසල් උපකරණවල අවශ්‍යතාවය නිසි පරිදි පුරෝකථනය කිරීමකින් තොරව මිලදී ගැනීම් කර තිබීම නිසා රු.මිලියන 3.15 ක් වටිනා පාසල් පොත් හා උපකරණ අයිතම 10 ක ඒකක 15,302 ක් ඉතිරි වී තිබුණු අතර ඉන් රු.143,170 ක් වූ පාසල් පොත් හා උපකරණ අයිතම 08 ක ඒකක හානියට පත් වී තිබුණි.	සුදුසුකම් නිරීක්ෂණය කර බෙදා දීමේදී අපේක්ෂිත සංඛ්‍යාවල විචලනය සිදුවීම මත පොත් ප්‍රමාණයක් ඉතිරිව ඇති බව.	අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් නොකිරීම සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2023 වර්ෂයේ සිට 2025 පෙබරවාරි 18 විගණිත දින දක්වා පාසල් පොත් හා උපකරණ බෙදා දීම සඳහා ගබඩාවෙන් නිකුත් කළ ප්‍රමාණ අනුව වටිනාකම රු.167,328 ක් වූ අයිතම 6 ක ඒකක 985 ක ඌනතාවයක් පැවතුණි.	ගබඩා ලේඛන නිසි පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව.	ඌනතාවයට බලපාන හේතු හඳුනාගෙන වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභා අරමුදලින් මුදල් වැයකර මිලදී ගෙන සභිකයින්ට බෙදා දී තිබූ රු. 773,100 ක් වටිනා ලැප්ටොප් 09 ක්, රු.395,991 ක් වටිනා ටැබ් 09 ක් හා රු.මිලියන 1.2 ක් වටිනා දුරකථන 28 ක් සහ වටිනාකම හඳුනා ගත නොහැකි පෙන් ඩ්‍රයිව් 10 ක් සහ මහා නගර සභා ආඥා පනත් 11 ක් සභිකයින් ගෙන් නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ජංගම දුරකථන ක්ෂය කිරීමට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද අතර ධාරිතා අගය නැවත අය කිරීමට මන්ත්‍රීවරුන්ව ලිපි මගින් දැනුවත් කර ඇතිබව.	කඩිනමින් අයකර ගැනීම් සිදුකළ යුතුය.

(ආ)	සභාව සතු රු.මිලියන 3.25 ක් වූ බොබ් කැට් යන්ත්‍රය, රු.මිලියන 3.05ක් වූ ගල් ඇඹරුම් යන්ත්‍රය, රු. 88,000ක් වූ බ්ලොක් ගල් හා ඉන්ටලොක් ගල් නිෂ්පාදන යන්ත්‍රය 2015 වර්ෂය හා සමාලෝචිත වර්ෂයේ අගෝස්තු දක්වා කාලය තුල අක්‍රිය තත්වයට පත්වී ඇති නමුත් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.	බොබ් කැට් යන්ත්‍රය හා ගල් ඇඹරුම් යන්ත්‍රය අළුත්වැඩියාවට කටයුතු යොදා ඇති බව.	මෙම යන්ත්‍ර කඩිනමින් අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 16.2 ක් වූ ගාල්ල මහානගර සභාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුව නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව පැවරූ කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී තිබුණද, නියමිත දිනට වැඩ අවසන් කර නොතිබුණි. කොන්ත්‍රාත්තුවට අදාළ රක්ෂණ ආවරණයේ වලංගු කාලය 2025 පෙබරවාරි 11 දිනෙන්ද, අත්තිකාරම් සුරක්ෂණයේ වලංගු කාලය 2025 මාර්තු 11 දිනෙන්ද කල් ඉකුත් වී තිබියදී 2025 අප්‍රේල් 05 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණු අතර ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ පළමු බිල්පතෙහි රු.මිලියන 2.67 ක ඉටු නොකළ වැඩ විෂයයන් ඇතුළත් කර තිබුණි.	සිදු කර ඇති වැඩ කොටස් ප්‍රමාණයට පමණක් ගෙවීමට කටයුතු කර ඇති බව.	ප්‍රමාද ගාස්තු අයකළ යුතු අතර ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් කර ඇත්නම් ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් හෝ ඉදිරි බිල්වලින් අඩුකර ගත යුතුය. තවද රක්ෂණාවරණයේ හා කාර්යසාධන සුරක්ෂණයේ කාලය දීර්ඝ කර ගත යුතුය.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 තිරසර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2030 තිරසර සංවර්ධන සඳහා න්‍යාය පත්‍රයට අනුකූලව සිය විෂය පථය අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගත යුතු වුවත් මහා නගර සභාව විසින් එසේ අරමුණු හා ඉලක්ක හඳුනාගෙන නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	තිරසර සංවර්ධන අරමුණු හඳුනාගත යුතුය.